උඩපළාත ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය.

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් පිළියෙළ කිරීමේ දී, උපචිත පදනම භාවිතා කර ඇති බව ගිණුම් තුළ හෙළිදරව් කර තිබුණ ද, ආදායම් විෂයයන් 07 ක දි හැර අනෙකුත් ආදායම් විෂයයන් හීදි මූල්‍ය පදනම භාවිතා කර තිබුණි.

(ආ) වසරකට නොඅඩු කාලයක් සඳහා ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණ රු.11,771,277 ක් ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවන ලෙස ජංගම වත්කම් යටතේ පෙන්වා තිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

---------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ කර්මාන්ත ණයගැති ශේෂයන් සඳහා 2013 වර්ෂයේ මුදල් ලැබීමේ දි අරමුදල් ලැබුණු මූලාශ්‍ර වෙන් වෙන්ව ගැළපීම් හා නිරවුල් කර ගැනිම සඳහා කටයුතු නොකර, එකිනෙක හිලව් කර ශේෂය වූ රු.12,869 ක මුදල් ජ'නල් සටහන් අංක 95 මගින් ගැලපීමට කටයුතු කර තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට කලින් ලද රු.179,852 ක ආදායම් අවසන් ගිණුම තුළ රු.155,618 ක් ලෙස ලේඛණගත කර තිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්.**

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හිග වරිපනම් බදු ගිණුමේ හා හිග විශ්‍රාම වැටුප් දායක මුදල් ගිණුමේ ශේෂය උපලේඛන සමග සැසදීමේ දි, රු.124,353 ක් හා හිග වරිපනම් බදු ආදායම් ගිණුම හා වරිපනම් ලේඛනය සමග සැසදීමේ දි රු.20,000 ක නොසැසදිමක් අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපලේඛනයේ වටිනාකම රු.3,729,753 ක් වුව ද, එහි නිවැරදි එකතුව රු.5,937,303 ක් වුයෙන්, රු.2,207,550 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය තුලින් ලේඛණගත නොකළ යන්ත්‍ර හා උපකරණ විෂයයන් **08** කට අදාළ අයිතමයන් **23** ක් හඳුනාගෙන තිබුණ ද ඒවා සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් වලට ගෙන නොතිබුණි.

**1.3.4** ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.

---------------------------------

(අ) ලැබියයුතු ගිණුම්.

--------------------

**2013** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතුව රු.**37,323,558** ක් වූ අතර, එයින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.**5,834,384** ක් වී තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්.

-------------------------

**2013** දෙසැම්බර් **31** දිනට එකතුව රු.**27,956,878** ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.**4,662,361** ක් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන් විය. එම ශේෂයෙන් **2014** දෙසැම්බර් **31** දිනට රු.**4,404,824** ක මුදලක් තවදුරටත් ගෙවියයුතුව පැවතුණි.

**1.3.5** විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් **06** කට අදාළ එකතුව රු.**123,815,209** ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------**

**පහත සදහන් නීති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය විය.**

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **2012 නොවැම්බර් 30 දිනැති අංක 1787 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය** | **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථානගත කර තිබුණු දැන්වීම් පුවරුවලින් රු.243,975 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.** |
| **(ආ)** | **1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බල පවත්වන රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය හා 2012 නොවැම්බර් 30 දරන ගැසට් නිවේදනය** | **බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත් ලබා ගතයුතු ගණයට ගැනෙන කර්මාන්ත 64 ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.** |

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,911,697 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,364,073 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.3,547,624 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**-------------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම් සියයට 58 කින් හා සේවා සඳහා ගාස්තු ආදායම සියයට 82 කින් වැඩි වී තිබුණ ද, එයට ප්‍රතිරූපව සැපයුම් හා උපකරණ වියදම සියයට 47 කින් ද, ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යතා හා සේවා සියයට 33 කින් ද, ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම් සියයට 30 කින් ද ඉහළ ගොස් තිබීමත්, ප්‍රාග්ධන ආධාර සියයට 34 කින් අඩුවීමත් හේතු කොට ගෙන, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සියයට 38 කින් අඩු වී තිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂයේ ස්ථිර කාර්යය මණ්ඩල වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.18,820,800 ක් මධ්‍යම පළාත් සභාව වෙතින් ලැබී තිබු නමුත්, වර්ෂයේ වියදම රු.17,938,801 ක් වුයෙන්, වැටුප් ප්‍රතිපූර්ණයෙන් රු.881,999 ක් ඉතිරි වී තිබුණි. එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණෙන්, එම සාධකය ද වර්ෂයේ අතිරික්තය වැඩිවීමට හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**---------------------------------**

**ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය සමාලෝචිත වර්ෂයේ දි 2.3:1 ක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ දි එය 3:1 ක් විය. ඉන් තොග වටිනාකම ඉවත් කළ පසු ක්ෂණික අනුපාතය 2.1:1 ක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ දි එය 2.8:1 ක් විය. මේ අනුව, සභාවේ ද්‍රවශීලතාව යහපත් තත්ත්වයක නොපවතින බව නිරික්ෂණය විය.**

## 2.4 ආදායම් පරිපාලනය.

-----------------------

### 2.4.1 වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,533,411 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,283,597 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිගයෙන් සියයට 21 ක් හා බිල් කිරීම්වලින් සියයට 48 ක් විය. 2013 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.1,831,329 ක් වූ ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් හිග හිට තිබුණ රු.689,374 ක මුදල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාර අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.4.2 බදු කුළී.

------------

2013 දෙසැම්බර් 31 දිනට රු.58,728 ක හිග ශේෂයක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.2,950 ක් විය. ඉන් වර්ෂය තුළ අය කර ගැනීම සියයට 0 ක් වූ අතර, වර්ෂය අවසාන හිගය රු.61,678 ක් විය. එම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දිනට රු.36,825 ක් තවදුරටත් අය වියයුතුව තිබුණ නමුත්, මෙම හිග මුදල් අය කර ගැනීම සඳහා සභාව මගින් නීතිමය පියවර ගෙන නොතිබුණි.

### 2.4.3 ජල ගාස්තු.

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,607,507 ක හිගයක් පැවති අතර, වර්ෂය තුළ බිල් කිරීම රු.500,250 ක් විය. ඉන් වර්ෂය තුළ අය කිරීම පිළිවෙළින් රු.147,804 ක් හා රු.96,504 ක් වුයෙන්, එහි ප්‍රතිශතය පිළිවෙළින් සියයට 9 ක් හා සියයට 19 ක් විය. වර්ෂය අවසානයේ හිගය රු.1,863,449 ක් වූ අතර, එම මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් අනුගමනය කර නොතිබුණි.

**2.4.4** කඩ කුළී.

----------

සභාව සතු කඩ කාමර සඳහා නොගෙවූ කුළී රු.**446,789** ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ දි පැවති අතර, වර්ෂය තුළ දි බිල් කිරීම රු.**2,305,628** ක් විය. ඉන් රු.**554,255** ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට හිග හිට තිබුණි. එම ශේෂයෙන් **2014** සැප්තැම්බර් **30** දිනට රු.**460,710** ක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.

**2.4.5** අක්කර බදු.

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිගය රු.**108,765** ක් වූ අතර, වර්ෂය තුළ බිල් කිරීම රු.**58,787** ක් විය. එම ආදායම් අය කර ගැනීම පිළිවෙළින් රු.**62,157** ක් හා රු.**31,668** ක් වුයෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.**73,728** ක් හිගව පැවතුණි. එම ශේෂයෙන් **2014** සැප්තැම්බර් **30** දිනට රු.**22,698** ක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.

**2.4.6** දුරකථන කුළුණු ගාස්තු

--------------------------

සභා බල ප්‍රදේශය තුල **2008 - 2010** කාල පරිච්ඡේදය අතරතුර ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු **17** ක් හදුනා ගෙන තිබුණ ද, ඒවා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවන් පනවා සභාව වෙත ආදායම් අය කර ගැනීම කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණි. මේ හේතුවෙන්, ස්ථාපිත කිරීමේ ගාස්තු රු.**1,650,000** ක් ඉක්ම වූ ආදායමක් සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු වසරකට රු.**102,000** ක ඉක්ම වූ ආදායමක් සභාවට අහිමිව තිබුණි.

**2.4.7** වෙනත් ආදායම්

---------------------

සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා නවාතැන් පොළ **05** ක් හදුනා ගෙන තිබුණ ද, **2013** වර්ෂයේ දී බලපත්‍ර ගාස්තු ලෙස අය කර තිබුණේ රු.**492,274** ක් පමණි. **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **149** වගන්තිය ප්‍රකාර නිවැරදිව ගණනය කර, එම ගාස්තු අය කර නොගැනීමෙන් සභාවට රැස් කළ හැකිව තිබු ආදායමක් අහිමිව තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ද්‍රවශීල අවශ්‍යතා සදහා අවශ්‍ය මුදල් ප්‍රමාණයට වඩා ඉතා අධික මුදල් ප්‍රමාණයක් දිගින් දිගටම ජංගම ගිණුම තුළ රදවා තැබීම හේතුවෙන්, සභාවට ලැබිය හැකිව තිබු පොළී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ජල මනු රහිතව ස්ථාවර ගාස්තු අය කිරීමක් මත පාරිභෝගික ස්ථාන **529** ක් සදහා ජල සැපයුම් ලබා දීමෙන් සභාවට අය කර ගත හැකි ආදායම් සීමා වී තිබුණි.

(ඇ) සභාව මගින් ක්‍රියාත්මක කර, පවත්වා ගෙන යනු ලබන ජල ව්‍යාපෘති සෞඛ්‍ය ආරක්ෂිතව හා නිසි සැළසුමකින්, අධ්‍යයනයකින් හා නිසි අධීක්ෂණයකින් තොරව සභාවේ වගකීම සම්පූර්ණයෙන් බැහැර කර, මහජනතාව වෙත පානීය ජලය සපයන බව විගණනයේ දි නිරීක්ෂණය විය. මේ ආකාරයෙන් පවත්වා ගෙන යන ජල ව්‍යාපෘතිවලින් **2013** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ජල ගාස්තු වටිනාකම රු.**1,863,449** ක් තුළ ව්‍යාජ බිල් කිරීම් හා දෝෂ සහගතව දක්වන ලද සැළකියයුතු මුදලක්

අන්තර්ගත වන බව සභාපතිවරයා මා වෙත ලබා දි ඇති පිලිතුරුවලින් තවදුරටත් අනාවරණය විය.

(ඈ) අනියම් පදනම මත බඳවා ගත් පුද්ගලයින් රියැදුරන් ලෙස වාහන ධාවනය සඳහා යොදවා ගෙන තිබුණි.

(ඉ) සභාවේ පවත්නා කාර්යය මණ්ඩල තනතුරු 25 ක් පුරප්පාඩුව පැවති අතර, සංවර්ධන නිලධාරී තනතුරු 02 ක අතිරික්තයක් පැවතුණි.

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුස්සැල්ලාව උප කාර්යාලය මගින් වසර ගණනාවක් තුළ නිවාස 12 ක් වෙනුවෙන් රැස් කර තිබු ගෙවල් කුළී ඇප තැන්පත් රු.28,224 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බල ප්‍රදේශය තුළ පවත්නා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබු අතර, ඒ හේතුවෙන්, වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණේ ආයතන 1212 ක් සඳහා පමණි. එය පෙර වර්ෂයේ 1525 සමග සසඳන විට සියයට 21 ක අඩුවීමකි.

(ඇ) කාර්යය මණ්ඩලයේ 03 දෙනෙකුගෙන් අය වියයුතු රු.61,100 ක ආපදා ණය මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලියාපදිංචි අංක CPPB – 7657 දරන කැබ් රථය අනතුරට පත් කර, රු.460,385 ක අලාභයක් සිදු කර තිබුණ ද, ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඉ) ලියාපදිංචි අංක 301-9057 දරන මෝටර් කාරයට සිදු වු අනතුරින් රු.105,455 ක අලාභයක් සිදුව තිබුණ ද, එය අය කර ගැනීමට හා අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2013 වර්ෂයේ දි අනවසර ඉදි කිරීම් 06 ක් සභාව වෙත වාර්තා වී තිබු අතර, ඒවා සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිලධාරී වාර්තා ලබා නොදීම

හේතුවෙන්, 2014 ජූලි වන තෙක් සභාව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**------------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට වටිනා කඩ හඳුනා ගත හොනැකි වත්කම් අයිතම 06 ක් දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතිණ.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

**--------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නියැදියකට අනුව භෞතික පරීක්ෂාවට ලක් වූ මාර්ග 07 ක ඇස්තමේන්තුවේ සඳහන් පරිදි හා ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූලව කටයුතු නොකළ අයිතමයන් සඳහා එකතුව රු.1,691,184 ක ගෙවීම් කාර්මික නිලධාරී සහතික කර තිබුණි.

(ආ) අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරූ මාර්ගවල කොන්ක්‍රීට් කුට්ටි ගල්වල තත්ත්ව සමීක්ෂණ වාර්තාවන් සඳහා රු.5,200 බැගින් මාර්ග 05 ක් සඳහා රු.26,000 ක් ගෙවීම් සහතික කර ඇතත්, එම වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**------------------------------------**

**4.1 සංයුක්ත සැළැස්ම.**

**---------------------**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**--------------------------**

**රු.44,288,502 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

**----------------------**

**සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම හේතුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.**

**4.5 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.6 අයවැය පාලනය.**

**------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 08 ක සියයට 13 සිට සියයට 142 ක් දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 15 සිට සියයට 76 ක් දක්වා ද, විචලනයන් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.**

**5. පද්ධති හා පාලන**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර  කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) අභ්‍යන්තර පාලනය**

**(ඇ) ආදායම්  පරිපාලනය**

**(ඈ) වත්කම් කළමනාකරණය**

**(ඉ) ණයගැති හා ණයහිමි පාලනය**

**(ඊ) තොග පාලනය**

**(උ) කොන්ත්‍රාත් පාලනය**